# 5. රජරට ශිෂ්ටාචාරය (පොළොන්නරුව අවසානය දක්වා)

**නිපුණතාව : ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ ව අවබෝධයෙන් කටයුතු කරයි**

**නිපුණතා මට්ටම : 5.1. රජරට ශිෂ්ටාචාරයේ දියුණු තාක්ෂණික පදනම හඳුන්වා දෙයි**

01. රජරට ශිෂ්ටාචාරය ආශ්‍රිතව ගොඩනගන ලද රාජධානි දෙක නම් කරන්න.

02. රජරට ශිෂ්ටාචාරය බිඳවැටුණු වර්ෂය සඳහන් කරන්න.

03. රජරට ශිෂ්ටාචාර සමයේ ආර්ථික කටයුතුවල ව්‍යුහය පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් කරන්න.

04." රජරට ශිෂ්ටාචාරය ජලාශ්‍රිත ශිෂ්ටාචාරයකි" විමසන්න.

**නිපුණතා මට්ටම : 5.2. රජරට ශිෂ්ටාචාරයේ දේශපාලන, ආර්ථික, සමාජ, සංස්කෘතික සහ තාක්ෂණය විස්තර කරයි.**

**5.2 අනුරාධපුර රාජධානිය**

- **පණ්ඩුකාභය රජු**

01. පණ්ඩුකාභය කුමරු රාජත්වයට පත්වීම සහ අනුරාධපුර රාජධානියේ පාලන කටයුතු සංවිධානය කළ ආකාරය පිළිබඳව විමසන්න.

- **දේවානම්පියතිස්ස රජු (ක්‍රි.පූ. 250 - 210 තෙක්)**

01. පහත සඳහන් තේමා යටතේ දේවානම්පියතිස්ස රජුගේ රාජ්‍ය සමයේ ඇති වැදගත්කම සාකච්ඡා කරන්න

(i) මෞර්ය අධිරාජ්‍ය සමග රජුගේ දේශපාලන සම්බන්ධතා

(ii) බුද්ධ ශාසනය පිහිටු වීම

(iii)සංස්කෘතික වර්ධනය

02. "දුටුගැමුණු රජතුමාගේ කාර්ය සාඵල්‍යය උත්කෘෂ්ඨ ලෙස මහාවංසයෙහි දක්වා ඇත".

(i)දුටුගැමුණු රජු උත්කෘෂ්ඨ ලෙස සැලකූ මහවංස කතුවරයා නම් කරන්න

(ii)දුටුගැමුණු රජුට පෙර මාගම පාලනය කළ රජවරු දෙදෙනෙකු නම් කරන්න

(iii)දුටුගරමුණු රජුගේ කාර්යසංසිද්ධිය සැකවින් දක්වන්න

- **වළගම්බා රජු (ක්‍රි.පූ. 89 - 77 තෙක්)**

01. වලගම්බා රජු අභිලේඛනවල හඳුන්වා ඇත්තේ කුමන නාමයෙන් ද?

02. වලගම්බා රාජ්‍ය සමයෙහි දී ලක්දිව ආක්‍රමණය කළ විදේශිකයින් කවුද?

03. වලගම්බා රාජ්‍ය සමයෙහි දී දේශීයව රාජ්‍ය විරෝධී කැරැල්ලක් සංවිධානය කළ පුද්ගලයා කවුද?

04. වලගම්බා රජ සමයෙහි පැවති සාගතය හඳුන්වන නම කුමක් ද?

05. "වලගම්බා රජු යනු අභියෝග රැසකට මුහුණ දී රාජ්‍ය බලය ලබාගත් ශ්‍රේෂ්ඨ නරපතියෙකි" විමසන්න

- **වසභ රජු (ක්‍රි. ව. 65-109)**

01. "මහ වැව් තැනවීමේ පුරෝගාමියා වසභ රජුය". විමසන්න.

❖ අනුරාධපුර රාජධානි සමයෙහි ආගමික තත්ත්වය පිළිබඳ විමසන්න.

❖ අනුරාධපුර රාජධානි සමයෙහි දී එල්ල වූ දකුණු ඉන්දීය ආක්‍රමණ පිළිබඳව විමසන්න

❖ අනුරාධපුර රාජධානි සමයට අයත් කලාශිල්ප පිළිබඳව විමසන්න

**පොළොන්නරු රාජධානිය**

- **පළමුවන විජයබාහු රජු**

01."පළමුවෙනි විජයබාහු රජු පොළොන්නරු යුගයේ සිට රජකළ ශ්‍රේෂ්ඨ පාලකයෙකි".
පහත සඳහන් මාතෘකා ඇසුරින් මෙම කියමන සාකච්ඡා කරන්න.
(i) විදේශ ආධිපත්‍යයෙන් රට මුදා ගැනීම සහ රට එක්සේසත් කිරීම
(ii) ඔහුගේ ශාසනික කටයුතු

- **පළමුවන පරාක්‍රමබාහු රජු**

01. මහාපරාක්‍රමබාහු රජුගේ විදේශ සම්බන්ධතා විචාරාත්මක ව විමසන්න

- **නිශ්ශංකමල්ල රජු**

01. පළමුවන පරාක්‍රමබාහු රජු සහ නිශ්ශංකමල්ල රජුගේ කාර්ය සාඵල්‍යය සන්සන්දනාත්මකව විමසන්න.

❖ "පොළොන්නරු රාජධානි සමයට අදාළ කලා ශිල්පවලට හින්දු ආගමික බලපෑමක් එල්ල විය". මෙම ප්‍රකාශය උදාහරණ දක්වමින් විමසන්න.

❖ පොළොන්නරු රාජධානි සමයේ සාහිත්‍ය සහ කලා ශිල්ප පිළිබඳ විමර්ශනය කරන්න.

❖ පොළොන්නරු රාජධානි සමයෙහි දී වාරිකර්මාන්ත සඳහා යොදාගත් තාක්ෂණික ප්‍රයෝගයන් පිළිබඳව විමසීමට ලක් කරන්න.

**නිපුණතා මට්ටම : 5.3. රජරට ශිෂ්ටාචාරයේ පදනම දුර්වල වීමෙන් එහි පරිහානිය හා බිඳවැටීම සිදුවූ ආකාරය පෙන්වා දෙයි.**

01. රජරට ශිෂ්ටාචාරයෙහි පරිහානියට සහ බිඳවැටීමට හේතු පැහැදිලි කරන්න.

02. "කාලිංග මාඝගේ ආක්‍රමණය රජරට ශිෂ්ටාචාරයේ බිඳවැටීමට හේතු විය" මෙම ප්‍රකාශයෙහි සත්‍ය අසත්‍යතාව විමසන්න.

# 6. රජරට ශිෂ්ටාචාරයෙන් පසු අවධිය

**නිපුණතාව : ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ ව අවබෝධයෙන් කටයුතු කරයි.**

**නිපුණතා මට්ටම : 6.1. ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරය මුල් පදනමින් වෙනස් වූ යුගයක් වෙත පිවිසීම හා එහි ක්‍රියාකාරීත්වය විමර්ශනය කරයි.**

01.කාලිංග මාඝගේ ආක්‍රමණයෙන් පසු රජරටින් නික්ම ගිය පිරිස් විවිධ පුද්ගලයන්ගේ නායකත්වය යටතේ ජනාවාස පිහිටුවා ගන්නා ලදී. එම නායකයන් සහ ජනාවාස පිහිටුවාගත් ප්‍රදේශ මොනවා ද?

**6.1. පාලන මධ්‍යස්ථාන**

**දඹදෙණි රාජධානිය**

- **තුන්වන විජයබාහු රජු**

01. තුන්වන විජයබාහු රජු පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී වැදගත්වන මූලාශ්‍රය මොනවා ද?

02තුන්වන විජයබාහු රජුව සමකාලීන මූලාශ්‍රයවල හඳුන්වා ඇත්තේ කුමන නාමයෙන් ද?

03. තුන්වන විජයබාහු රජුගේ ආගමික සේවාවන් තුනක් ලියන්න.

- **දෙවන පරාක්‍රමබාහු රජු**

01. "දෙවෙනි පැරකුම්බා රජු විදේශීය ග්‍රහණයෙන් දිවයින මුදවා ගනිමින් ශක්තිමත් පාලනයක් ගොඩනැගූ ශ්‍රේෂ්ඨ පාලකයෙකි".
(i) දෙවෙනි පරාක්‍රමබාහු රජුගේ පියා නම් කරන්න
(ii) මෙතුමා විසින් රචනා කරන ලදැයි සැලකෙන ග්‍රන්ථ දෙකක් නම් කරන්න
(iii) දෙවෙනි පැරකුම්බා රජුගේ ආගමික සේවාව පැහැදිලි කරන්න
(iv) ඉහත ප්‍රකාශයට අවධානය යොමු කරමින් දෙවෙනි පැරකුම්බාවන්ගේ ශ්‍රේෂ්ඨත්වය විමසීමට ලක් කරන්න.

02. දෙවෙනි පරාක්‍රමබාහු රජුගේ දේශපාලන හා සංස්කෘතික කාර්ය සංසිද්ධි සැකෙවින් සාකච්ඡා කරන්න.
03. දඹදෙණි යුගයෙහි අධ්‍යාපනය සහ සාහිත්‍ය කටයුතු පිළිබඳව විචාරාත්මකව විමසන්න.

**යාපහුව රාජධානිය**

- **පළමුවෙනි බුවනෙකබාහු රජු (ක්‍රි.ව. 1272 - 1284)**

01. මෙකල සිදුවූ සිංහල වන්නි ප්‍රධානීන්ගේ කැරැල්ලට සම්බන්ධ වූ පුද්ගලයන් කවුද?

02. මෙකල ලක්දිවට එල්ල වූ දකුණු ඉන්දීය ආක්‍රමණය මෙහෙය වූ පුද්ගලයන් කවුද?

03. මෙකල විදේශීය සබඳතා පැවැත් වූ රටක් පිළිබඳව අරාබි ලේඛනයක සඳහන් වේ. එම රටේ නම කුමක්ද?

- **පළමුවන බුවනෙකබාහු රජුගෙන් පසු අවධිය**

01. මෙසමයෙහි එල්ල වූ විදේශීය ආක්‍රමණය සහ එහි දී ලක්දිවින් පැහැරගෙන ගිය පූජනීය වස්තූන් මොනවාද?

**කුරුණෑගල රාජධානිය**

**හතරවෙනි පරාක්‍රමබාහු රජු (පණ්ඩිත පරාක්‍රමබාහු) ක්‍රි.ව. 1302 - 1326**

01. හතරවන පරාක්‍රමබාහු රාජ්‍ය සමයෙහි දී සිදු වූ ආගමික සහ සාහිත්‍යය සේවාවන් මොනවා ද?

**ගම්පොළ යුගය**

01. මෙකල ලක්දිවට පැමිණි අරාබි ජාතික දේශාටකයා කවුද?

02. ගම්පොළ රාජධානි සමයෙහි ප්‍රභලව සිටි සේනාධිලංකාර සෙනවිරත් ප්‍රභූ පවුල සහ අලගක්කෝණාර හෙවත් අලකේශ්වර ප්‍රභූ පවුල පිලිබඳ විස්තරයක් කරන්න.

03. ගම්පොළ යුගයෙහි සාහිත්‍ය සහ කලා ශිල්ප පිළිබඳ කෙටි සටහනක් ලියන්න.

**නිපුණතා මට්ටම : 6.2. යාපන රාජධානි පිළිබඳ විමර්ශනය කරයි.**

**6.2 යාපන රාජධානිය**

01. යාපන රාජධානිය පිළිබඳ තොරතුරු ලබාගත හැකි මූලාශය තුනක් නම් කරන්න.

02. යාපන රාජධානිය පාලනය කළ ආර්ය චක්‍රවර්තී පරපුරට අයත් පාලකයන් දොළොස්දෙනා නම් කරන්න.

03. පෘතුගීසීන් විසින් යාපන රාජධානියේ බලය සියතට ලබාගත් වර්ෂය සඳහන් කරන්න.

04. යාපන රාජධානියේ නැගීම පිළිබඳ කෙටි සටහනක් ලියන්න.

**නිපුණතා මට්ටම : 6.3. කෝට්ටේ රාජධානිය පිළිබඳ විමර්ශනය කරයි.**

- **හයවන පරාක්‍රමබාහු රජු**

01. හයවන පරාක්‍රමබාහු රාජ්‍ය සමය පිළිබඳව අධ්‍යයනයේ දී වැදගත්වන සාහිත්‍ය සහ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය මොනවාද?

02. හයවන පරාක්‍රමබාහු රජුගේ මව සහ පියා නම් කරන්න.

03. ''හයවෙනි පරාක්‍රමබාහු රජුගේ දීර්ඝ රාජ්‍ය සමය යුද්ධය මෙන්ම සාමය සම්බන්ධ කාර්ය සංසිද්ධින් අතින් ශ්‍රී ලංකා ඉතිහාසයේ අවසාන කීර්තිමත් අවධිය විය''. සාකච්ඡා කරන්න.

04. කොට්ටේ යුගයේ අධ්‍යාපන හා සාහිත්‍ය කටයුතු විමසීමට ලක් කරන්න.

- **පහත සඳහන් ඓතිහාසික ස්ථාන ශ්‍රී ලංකා සිතියමක ලකුණු කරන්න.**

අනුරාධපුරය, සිතුල්පව්ව, තිස්සමහාරාමය, සීගිරිය, පොළොන්නරුව, වාකිරිගල, මහානාගහුල, මින්නේරි වැව, හුරුලු වැව, තිසාවැව, යෝධ වැව , කලාවැව, ගිරිතලේ වැව, කන්තලේ වැව, පරාක්‍රම සමුද්‍රය, ජයගඟ,

මිණිපේ ඇළ, සුබපබ්බත, ගෝවින්දමලය, මිණිපේ, දඹදෙණිය, යාපහුව, බෙලිගල, කැලණිය, දෙවිනුවර, රත්නපුර, කුරුණෑගල, ගම්පොල, දැදිගම, රයිගම, යාපනය, කෝට්ටේ, අත්තනගල්ල




එස්. එම්. එච්. කේ. සෙනෙවිරත්න

ර/ ශාන්ත ලූක්ස් විද්‍යාලය